<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>

<u>ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>

අංක 1971/17 හා 2016.06.15 , අංක 2032/33 හා 2017.08.17 , අංක 2146/22 හා 2019.10.22 , අංක 2162/10 හා 2020.02.10 , අංක 2165/14 හා 2020.03.03, අංක 2234/12 හා 2021.06.29, අංක 2264/11 හා 2022.01.26 හා අංක 2277/58 හා 2022.04.29 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයන්ගෙන් සංශෝධිත, අංක 1880/26 දරන 2014.09.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3.1 වගන්තිය අනුව සපුරාලිය යුතු සුදුසුකම් පිළිබඳ විස්තර පහත සඳහන් කර ඇත. ඒ අනුව සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමට මෙයින් කටයුතු කරනු ලැබේ.

2.1 විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්:-

i. අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම. *(ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉමෙන් උසස්වීම සඳහා අදාල කරගත් පශ්චාත් උපාධියක්, මෙම උසස්වීම සඳහා අදාල කරගත නොහැක)*

ii. උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.

iii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට, සුදුසුකම් ලබන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ වසර දහ අටකට (18) නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

v. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

vi. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

vii. අයදුම්කරුවෙකු විසින් ඔහු හෝ ඇය ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන තනතුර අයත් ධාරාවන් යටතේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ තනතුරකට පත් කරනු ලැබ තිබිය යුතුය. පුරප්පාඩුව පවතින තනතුර හා එම තනතුර අයත් වන ධාරාවන් පහත සඳහන් කර ඇත.

| කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ඇති පරිදි උසස් කිරීමට අදාළ තනතුර | අදාළ ධාරාවන් | පුරප්පාඩු වූ දිනය |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්,<br>ධීවර අමාත්‍යාංශය | කෘෂි සංවර්ධන/කෘෂි පර්යේෂණ/<br>කෘෂි ආර්ථික විද්‍යා | 2023.05.31 |

**03.** උසස් කිරීමේ ක්‍රමය :-

**3.1** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදු කරනු ලබන සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පරීක්ෂා කිරීමකින් අනතුරුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන නිර්දේශයන් ඉදිරිපත් කරන අතර , ඒ සඳහා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයකට නොවැඩි , පුරප්පාඩුවට නියමිත ධාරාවන්ට අයත් I ශ්‍රේණියේ අයදුම්කරුවන් සංඛ්‍යාවක් ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

**3.2** නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය පදනම් කරගෙන විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලබන අතර , එක් එක් උසස්වීම් දිනට අදාළ ජ්‍යෙෂ්ඨතා ලේඛනය, එම එක් එක් දිනයන්ට උසස්වීමට සුදුසුකම් ලැබූ නිලධාරීන් උසස් වීමට පෙර පැවති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලින් සැකසේ.

**3.3** අදාළ පුරප්පාඩු දිනයට උසස් කරන ලද නිලධාරීන් විශ්‍රාම ගැනීම නිසා නැවත ඇති වන පුරප්පාඩු සඳහා එදිනට සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් අතුරින් ඉහත 3.2 හි සඳහන් පරිදි කටයුතු කර අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

**04.** පුරප්පාඩුව ඇති වූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණිය සඳහා උසස් කරනු ලබන අතර, අයදුම්කරුවන් විසින් මූලික සුදුසුකම් පුරප්පාඩු දිනට සම්පූර්ණ කළ යුතුවේ. ඔබ විසින් මේ සමඟ වන ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පතක්, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් මගින් **2024.01.20** දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර, සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**05.** ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් , අයදුම්පතක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා සිටින අතර, දැනට විශ්‍රාම ගෙන සිටියේ වුව ද , ඉහත පරිදි උසස් කිරීමට නියමිත දිනය තෙක් සේවයේ යෙදී සිටි, උසස්වීම් ලැබීමට ඉහත **2.1** ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් හට මෙම උසස්වීම සඳහා ඉල්ලුම් කළ හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි ,

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

...................................

ජානක ධර්මකීර්ති,
ලේකම්,
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

දිනය:- 2023.12. 22